**වනසත්ව සංරක්ෂණ අරමුදල - 2023**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වනසත්ව සංරක්ෂණ අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 02 ඡේදය ප්‍රකාරව උපචිත පදනම අනුගමනය කර ඇති බවට මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දැව දර විකිණීමෙන් ලැබිය යුතු රු.1,127,473 ක ආදායම ගිණුම්ගත කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම හා ලැබිය යුතු ආදායම රු.1,127,473 ක් බැගින් අඩුවෙන් දැක්වුණි. | මෙම වරද 2024 වර්ෂයේ ගිණුම් සැකසීමේදී සංසංදනාත්මක අගයන් සමඟ නිවැරදි කිරීමට කටයුතු කරමි. | උපචිත පදනම අනුගමනය කරමින් ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | දේපළ පිරියත හා උපකරණ පිරිවැය වටිනාකම තුළ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු දැනටමත් භාවිතයට ගන්නා පිරිවැය රු.31,572,314 ක් වූ රථ වාහන 11 ක්, පිරිවැය රු.13,476,696 ක් වූ කාර්යාල උපකරණ 03 ක් සහ පිරිවැය රු.1,299,577 ක් වූ අයිතම ගණන සඳහන් නොවූ පශ්චාත් මරණ පරීක්ෂණ උපකරණ පැවතිය ද, මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන පාර්ශවවලට පැහැදිලි වන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 92(ආ) ඡේදය ප්‍රකාරව එම වත්කම්වල දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී අදාළ වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 7 පරිදි හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උද්‍යාන පිවිසුම් ගාස්තු, සේවා ගාස්තු, වාහන ඇතුළත් කිරීමේ ගාස්තු, | 2023 දෙසැම්බර් 31 දින වන විට එම ආදායම් තොරතුරු | උද්‍යාන හා ප්‍රාදේශීය කාර්යාල මඟින් එකතු |

| | | | |
|---|---|---|---|
| | බංගලාවල රෙදිපිළි කුලියට දීම සහ ඇත් අතුරු සෙවන පහසුකම් යන අංශ යටතේ කලාප කාර්යාලවලින් එකතු කර සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලයේ බැංකු ගිණුමට මාරු කර තිබූ රු.378,332,174 ක් ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණද මුදල් පොතට ඇතුළත් කිරීමට කටයුතු නොකර බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් තැන්පතු වශයෙන් හා ලැබිය යුතු ආදායම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රධාන කාර්යාලය වෙත නොලැබීම හා ඉලෙක්ට්‍රොනික කාඩ්පත් මඟින් කළ ගනුදෙනු නිරවුල් කිරීමට යම් කාලයක් ගතවන බැවින් මුදල් පොතට ගැනීමට නොහැකි විය. එහෙත් එම ආදායම් උපචිත පදනම මත නිවැරදිව ගිණුම්ගත කර ඇත. | කරන ආදායම් ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීමේ ක්‍රමවේදයක් සකස් කර එම ආදායම් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීමට සහ ඉදිකිරීම් සඳහා වැය කර තිබූ රු.102,205,564 ක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ජංගම නොවන වත්කම් අඩුවෙන් ද එම වත්කම්වලට අදාළ ක්ෂය ගණනය සිදු වී නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය වියදම හා සමුච්චිත ක්ෂය ද අඩුවෙන් දැක්වුණි. | මෙම භාණ්ඩ මිලදී ගෙන ඇත්තේ දැනටමත් ඉදිකොට ඇති විදුලි වැටවල නඩත්තු කටයුතු සඳහා වේ. | ස්ථාවර වත්කම් ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනිත කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාතර්ා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| විදුලි වැට ඉදිකිරීම් (නොනිමි වැඩ) ශේෂය | 318,959,267 | 21,163,316 | 297,795,951 | විදුලි වැට ඉදි කිරීම් (නොනිමි වැඩ) යටතේ දක්වා ඇති රු. 297,795,951 කට අදාළ උපලේඛනය ද 2024.06.30 දිනට පෙර ලබා දෙමි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අගයන් අනුරූපී වාර්තාවල ඇතුළත් අගයන් සමඟ සමාන විය යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලින් නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි | | | |
| | i. මුදල් රෙගුලාසි අංක 877 (1)(ඇ) | අරමුදලේ 2023 වර්ෂයේ අයවැය ලේඛනය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් විමසා පසුවට පිළිතුරු ලබා දීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | ii. මුදල් රෙගුලාසි අංක 877 (2)(අ) | සෑම අරමුදලක් සඳහාම වෙනම බැංකු ගිණුමක් පවත්වා ගෙන යා යුතු වුවත් අරමුදලේ කටයුතු දෙපාර්තමේන්තු බැංකු ගිණුම මඟින් පොදු තැන්පත් ගිණුම හරහා සිදු කර තිබුණි. | මේ සම්බන්ධව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසා ඇති අතර, ලබා දෙන උපදෙස් අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,517,770,342 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 248,108,226 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,269,662,116 ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර ප්‍රවේශපත්‍ර මිල ගණන් ඉහළ දැමීම හා පැමිණෙන නරඹන්නන් සංඛ්‍යාව වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරණ තොටුපල සංචාරක නිවාසය සාමාන්‍ය සංචාරකයන් සඳහා වෙන් නොකර අමාත්‍යවරයාගේ ලිඛිත අවසරය මත විශේෂ පුද්ගලයින් සඳහා පමණක් වෙන්කර තිබීමත් පහළ හේන්තොට සංචාරක බංගලාව මාර්ගගත ක්‍රමයෙන් තොරව කුසපත් ඇදීමේ ක්‍රමය මඟින් වෙන් කිරීමත් නිසා එලෙස වෙන් නොකළ දිනයන් සඳහා ද වෙනත් සංචාරකයන්ට වෙන්කර දීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලබාගත හැකිව තිබූ දළ ආදායම රජයට අහිමි වී මහජනයාට පහසුකම ද අහිමි වී තිබුණි. | පරණ තොටුපල සංචාරක නිවාසය වෙන්කර ගැනීම පිණිස ලැබෙන විමසුම්, අමාත්‍යවරයා විමසා වෙන්කර දීමට ද පහළ හේන්තොට සංචාරක නිවාසය 2024.03.25 දින සිට මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ වෙන් කිරීමට ද අවශ්‍ය පහසුකම් සපයා ඇත. | සංචාරක නිවාස වෙන් කිරීම සාධාරණ පදනමකින් මහජනතාවට පහසුකම් සැලසෙන ආකාරයට සිදු කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | උඩවලව ප්‍රදේශයේ මීටර් 500 කට ඇතිරීම සඳහා වනඅලි සංචරණ බාධක තැටි 6,000 ක් සහ කිලෝමීටර් 1,500 ක් දිග විදුලි වැට ඉදි කිරීම සඳහා අවශ්‍ය උපකරණ රු.87,308,715 කට දින 90 ක් තුළ රාජ්‍ය සමාගමක් වෙතින් සපයා ගැනීම සඳහා 2021 මාර්තු 15 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී තිබුණි. ඒ අනුව ලැබී තිබූ රු.13,436,932 ක් වටිනා අයිතම පමණක් ලැබී තිබුණු අතර ඒවායේ තත්ත්ව පරීක්ෂාවන් සිදු කිරීමෙන් තොරව භාර ගැනීම නිසා සවි කිරීමට නොහැකිව ගබඩා කර තිබූ ස්ථානවල කැඩී බිඳී විනාශ වී ගොස් තිබුණි. නියමිත පරිදි සැපයුම් සිදු නොකිරීම නිසා 2022 දෙසැම්බර් 30 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණු අතර ලබා දුන් වැඩ මූලික අත්තිකාරම් මුදල වූ රු.8,017,640 ක් ඊට අදාළ අත්තිකාරම් බැඳුම්කරයෙන් හෝ පියවා ගැනීමට නොහැකි වී තිබුණි. | තව දුරටත් අයවීමට තිබෙන රු.8,017,640 ක මුදල ගෙවන ලෙස අදාළ ආයතනය වෙත දන්වා ඇත. | අය වීමට ඇති මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2. ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ට අදාළ අතිරේක 35 හි 6.3.3(ආ), 2.8.1(ඇ) හා 3.12 මාර්ගෝපදේශයන් අනුව ඇස්තමේන්තු ගත වටිනාකම රු.මිලියන 299 ක් වූ 2023 වර්ෂය වෙනුවෙන් අලි වෙඩි මිලදී ගැනීම අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හරහා සිදු කළ යුතු වුවද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව හරහා සිදු කර තිබීම, ලංසු ලැබී දින 04 කට පසුව ලංසු විවෘත කර තිබීම, විශේෂිත භාණ්ඩයක් වූ අලි වෙඩි මිලදී ගැනීමේදී පූර්ව සුදුසුකම් පරීක්ෂා නොකර වසර 05 ක් තිස්සේ එකම සැපයුම්කරුවෙකුගෙන් පමණක් මිලදී ගැනීමට කටයුතු කිරීම යනාදි කරුණු නිරීක්ෂණය විය. | අලිවෙඩි මිලදී ගැනීම ඉතාම සංකීර්ණ කටයුත්තක් වන අතර නියමිත පිරිවිතරයන්ට අනුකූලව නියමිත දිනට භාණ්ඩ සපයා ගැනීම නොකළ හොත් විශාල ගැටළුවලට මුහුණදීමට සිදුවන අතර පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා මාස 03 ක් පමණ ගත වන බැවින් ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ මිලදී ගැනීම සිදු කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 05 ක් සඳහා අනුමත ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.643,715,000 ක් වුවද, තථ්‍ය වියදම රු.815,644,319 ක් වූයෙන් රු.171,929,319 ක් ඇස්තමේන්තුව ඉක්මවා අනුමැතියකින් තොරව වැය කර තිබුණු අතර එම ඉක්ම වීම සියයට 26.7 ක් විය. | ඇස්තමේන්තු මුදල් පදනමට සකස් කරන අතර, වියදම උපචිත පදනමට ගිණුම්ගත කරන බැවින් මෙලෙස වෙනසක් පෙන්නුම් කෙරේ. | අයවැය ඇස්තමේන්තුව ඉක්මවා නොයන පරිදි සැලසුම් සහගතව වියදම් දැරීමටත්, අවශ්‍ය අවස්ථාවලදී අයවැය සංශෝධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු නොකළ අධ්‍යාපන හා ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් රු.2,014,077 ක වියදමක් දරා තිබුණි. | පිළිතුරක් ඉදිරිපත් කර නොතිබුණි. | අයවැය ඇස්තමේන්තුව නිවැරදිව සකස් කළ යුතුය. |